# විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය
# விஞ்ஞான மற்றும் தொழிநுட்ப அமைச்சு
# Ministry of Science and Technology

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது இல.<br>My Ref. | MOST/ADM(VIDATHA)/13/<br>ANNU.TR./FC/26 | ඔබේ යොමුව<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2025.08.06 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු මඟින්
සියළුම ප්‍රාදේශීය ලේකම්වරු මඟින්

විදාතා සම්පත් මධ්‍යස්ථානවල/ දිස්ත්‍රික් විදාතා ඒකකවල සේවය කරන පහත තනතුරුවලට අයත් නිලධාරීන්

1. විද්‍යා හා තාක්ෂණ නිලධාරී/ සංවර්ධන නිලධාරී/ තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන සහකාර
2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු
3. ක්ෂේත්‍ර සම්බන්ධීකාරක
4. කාර්යාල කාර්ය සහායක
5. කාර්යාල මුරකරු

**2026 වර්ෂය සඳහා විදාතා ඒකකයේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් සඳහා වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම**

මෙම අමාත්‍යාංශය යටතේ විදාතා ඒකකවල/ දිස්ත්‍රික් විදාතා ඒකකවල සේවය කරන දිස්ත්‍රික් විදාතා නිලධාරීන් හැර සෙසු සියළුම තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා 2026.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා අපේක්ෂිත කාල රාමුව පහත පරිදි වේ.

| අනු අංකය | ක්‍රියාකාරකම | යෝජිත අවසන් දිනය |
|---|---|---|
| 01 | වාර්ෂික ස්ථාන මාරු කැඳවීම පිළිබඳව දැනුම්දීම | 2025.08.06 දින |
| 02 | අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය | 2025.08.25 දින |
| 03 | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ස්ථාන මාරු කමිටුවට භාරදීම | 2025.09.01 දිනට පෙර |
| 04 | වාර්ෂික ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම | 2025.09.23 දිනට පෙර |
| 05 | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | 2025.09.30 දින |
| 06 | අභියාචනා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය | 2025.10.15 දින |
| 07 | අභියාචනා සමාලෝචනය අවසන් කිරීම | 2025.11.07 දිනට පෙර |
| 08 | අවසන් ස්ථාන මාරු යෝජනා අමාත්‍යාංශ ලේකම් වෙත භාරදීම | 2025.11.10 දිනට පෙර |
| 09 | අවසන් ස්ථාන මාරු නියෝග දැනුම් දීම | 2025.11.15 දිනට පෙර |
| 10 | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක වන දිනය | 2026.01.01 |

03. ඉහත තනතුරුවලට අයත් නිලධාරීන් සඳහා වෙන වෙනම ස්ථාන මාරු මණ්ඩල හා ස්ථාන මාරු අභියාචනා සමාලෝචන මණ්ඩල ස්ථාන මාරු පටිපාටිය අනුව පත් කරනු ලැබේ.

03. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අදාළ ස්ථාන මාරු නියෝග හා ස්ථාන මාරු අභියාචනා සමාලෝචන තීරණ එක් එක් තනතුරුවලට අදාළ වන සේ වෙන වෙනම **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයීය නිල වෙබ් අඩවියේ පමණක්** (https://most.gov.lk/) පළ කරනු ලැබේ.

3 වන මහල, "සෙත්සිරිපාය" 1 වන අදියරය, බත්තරමුල්ල.
3வது தளம், "செத்சிறிபாய" கட்டம், பத்தரமுல்லை.
3rd floor, "Sethsiripaya" Stage I, Battaramulla.

කාර්යාලය / காரியாலயம் / Office
(+9411) 2879410
(+9411) 2879412
motrdevelopment@gmail.com
www.mostr.gov.lk

04. මෙම ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරීන් වෙත වෙන වෙනම ලිපි නිකුත් නොකරන අතර ස්ථාන මාරු නියෝග ලද නිලධාරීන් ස්ථාන මාරු නියෝග ලැයිස්තුව වෙබ් අඩවිය තුළින් බාගත කරගෙන අදාළ දිස්ත්‍රික් ලේකම්වරු/ප්‍රාදේශීය ලේකම්වරු වෙත ඉදිරිපත් කර අදාළ දිනට නව සේවා ස්ථාන වෙත සේවයට වාර්තා කළ යුතු වේ.

05. මෙම ස්ථාන මාරු ක්‍රියාවලියට අදාළ ලේඛන බාගත කර ගැනීම සඳහා අදාළ වෙබ් සබැඳි හා QR කේත පහත දැක්වේ.

| ලේඛනය | සබැඳිය | QR කේතය |
|---|---|---|
| ස්ථාන මාරු පටිපාටිය | https://most.gov.lk/web/images/2025/transfer_procedure_-_publish.pdf | |
| ස්ථාන මාරු අයදුම්පත ( 'අ' ආකෘතිය -ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන් සඳහා) | https://most.gov.lk/web/images/2025/Application_A.pdf | |
| ස්ථාන මාරු අයදුම්පත ('ආ' ආකෘතිය -වසර 05කට වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් සඳහා) | https://most.gov.lk/web/images/2025/Application_B.pdf | |
| ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුව වෙත කරුණු දැක්වීමේ අයදුම්පත්‍රය | https://most.gov.lk/web/images/2025/Appeal_Application.pdf | |

06. ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධරයන් එම සේවාවන්ට අදාළ වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරීම අනුව විද්‍යා හා තාක්ෂණ නිලධාරී/ සංවර්ධන නිලධාරී/ තාක්ෂණ හා මානව සම්පත් ප්‍රවර්ධන සහකාර හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර / පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු යන තනතුරු සඳහා පමණක් ස්ථාන මාරු ක්‍රියාවලිය ඉහත දක්වා ඇති කාල රාමුවෙන් අපගමනය විය හැකි බවත්, එසේ වුවහොත් ඒ පිළිබඳව ඉදිරියේ දී දැනුම් දීමට කටයුතු කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

07. මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධව වැඩිදුර විස්තර හෝ විමසීම් සඳහා අධ්‍යක්ෂ (විදාතා) දුරකථන අංක 070-4720836 ඔස්සේ සම්බන්ධ කර ගත හැකි ය. තවද ස්ථාන මාරු ක්‍රියාවලියට අදාළ ලිපි සන්නිවේදන කටයුතු සඳහා විදාතා ඒකකයේ නිල විද්‍යුත් තැපැල් ලිපිනය වන vidathaoffice@gmail.com ද භාවිතා කළ හැකි ය.

08. ඒ අනුව ස්ථාන මාරු සඳහා අයදුම්පත් ඉහත කාල රාමුව අනුව 2025.08.25 දිනට පෙර අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස දන්වා සිටිමි.

**ඒ. ලක්කදාස්**
අතිරේක ලේකම්
ලේකම් වෙනුවට

පිටපත්

1. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
2. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
3. සියළුම දිස්ත්‍රික් විදාතා නිලධාරීන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.